**ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව - 2017**

---

ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, සංචිත වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ 37(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිෂන් සභාවේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය, මෙහෙයුම් වියදම් සඳහා සෙස් අරමුදලින් මාරුකිරීම් සැලකිල්ලට ගැනීමට පෙර රු. 391,794,822 ක ශුද්ධ ඌනතාවයක් වූ අතර ඉකුත් වර්ෂයේදී ශුද්ධ ඌනතාවය රු. 331,278,495 ක් ලෙස වාර්තා විය. වර්ෂය සඳහා සෙස් අරමුදලින් මාරුකිරීම් සැලකිල්ලට ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය රු. 3,835,003 ක් වූ අතර ඉකුත් වර්ෂයේදී රු. මිලියන 22 ක අතිරේක මුදලක් සෙස් අරමුදලින් මාරුකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඉකුත් වර්ෂයේදී ශුද්ධ අතිරික්තය රු. 38,313,564 ක් ලෙස වාර්තා විය.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා සහ ඉකුත් වර්ෂය සඳහා පිළිවෙළින් රු. මිලියන 396 ක් වූ සහ රු. මිලියන 370 ක් වූ මෙහෙයුම් වියදම් දැරීම සඳහා සෙස් අරමුදලින් මාරුකිරීම් ඇතුළත්ව කොමිෂන් සභාවේ ආදායම පිළිවෙළින් රු. මිලියන 427 ක් සහ රු. මිලියන 401 ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී මුළු ආදායමෙහි සියයට 6.5 ක වර්ධනයක් දැක්වුණි. කෙසේ වුවද,සමාලෝචිත වර්ෂය තුළ ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන කටයුතු සඳහා දරන ලද වියදම රු.මිලියන 72 ක් පමණක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රු. මිලියන 42 ක් වූයෙන් ප්‍රාග්ධන වෙළඳපොල සංවර්ධන කටයුතු සඳහා මුළු වියදමෙන් සියයට 17ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණි.තවද, සමාලෝචිත වර්ෂය සඳහා කාර්ය මණ්ඩල වැය ලෙස මුළු වියදමෙන් සියයට 46.5 කට සමාන මුදලක් වැය කර තිබූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේදී එය සියයට 49 ක් විය.

(ආ) තාවකාලික පැවරුම් සඳහා සේවය ලබා ගැනීම, නීති උපදේශන සේවා සහ අනෙකුත් උපදේශන සේවා වැනි විවිධ අරමුණු සඳහා සේවය ලබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.12,866,350 ක් වෘත්තීය ගාස්තු ලෙස වැය කර තිබුණු අතර ඉකුත් වර්ෂය සහ 2015 වර්ෂය සමඟ සැසඳීමේදී එය පිළිවෙලින් සියයට 46.3 කින් සහ සියයට 894 කින් වැඩි වී තිබුණි.

(ඇ) ප්‍රාග්ධන වෙළඳපොල හා නිපයුම් ප්‍රවර්ධනය සඳහා සමාලෝචිත වර්ෂයේ වියදම රු. මිලියන 46.7 ක් විය. එහි ප්‍රධාන වශයෙන් තැරැව්කරුවන්ගේ පසුපෙල කාර්යාල පද්ධතිය (Broker Back Office Systems) සහ ඇණවුම් කළමනාකරණ පද්ධතිය (Order Management System) සඳහා වැය කරන ලද රු. මිලියන 25.4 ඇතුළත් වේ. තවද සුරැකුම්පත් කොමිෂන් සභාවන්ගේ ජාත්‍යන්තර සංවිධානයේ (IOSCO) වර්ධනය වන හා මතුවන වෙළඳපොල පිළිබඳ වූ කමිටුවේ සහ ආසියානු ශාන්තිකර ප්‍රාදේශීය කමිටුවේ වාර්ෂික රැස්වීම හා සම්මන්ත්‍රණය සඳහා වන වියදම් වෙනුවෙන් රු. මිලියන 17.4 ක් වැය කර තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**4.1** **කාර්යසාධනය**

----------------

විගණනය සඳහා ලද තොරතුරු ප්‍රකාරව, ශ්‍රී ලංකාවේ ප්‍රාග්ධන වෙළඳපොල නියාමකයෙකු ලෙස කොමිෂන් සභාවේ කාර්යසාධනය පහත පරිදි සාරාංශ ගත කර ඇත.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අධීක්ෂණ අංශයේ අධීක්ෂණය යටතේ අස්තිත්වයන් 93 ක් පවතී. මෙම අංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා විශේෂ වැඩබිම මත පරීක්ෂාවන් 4 ක් හැර සමාගම් 55 ක වැඩබිම මත පරීක්ෂාවන් ( On-site inspections) අවසන් කර ඇති අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේදී විශේෂ වැඩබිම මත පරීක්ෂාවන් 2ක් හැර සමාගම් 53 ක වැඩබිම මත පරීක්ෂාවන් අවසන් කර තිබුණි. නියාමනය වන හා බලපත්‍රලාභී අස්තිත්වයන් විසින් මතු කරන ලද අවදානම් තක්සේරුවක් මඟින් වැඩබිම මත පරීක්ෂාවන් සිදුකරන බව තවදුරටත් නිරීක්ෂණය විය.

(ආ) කොමිෂන් සභාවේ සංස්ථාපිත කටයුතු අංශයේ සමාලෝචිත වර්ෂයේ කාර්යසාධනය ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත සඳහන් වගුවේ දක්වා ඇත.

| ක්‍රියාකාරකම | තථ්‍ය කාර්යසාධනය | |
|---|---|---|
| | 2017 | 2016 |
| පැමිණිලි විසඳීම | පැමිණිලි 38 ක් අතුරින් පැමිණිලි 36 ක් විසඳා ඇත. | පැමිණිලි 52 ක් අතුරින් පැමිණිලි 50 ක් විසඳා ඇත. |
| කොමිෂන් සභා පනතේ 28 වන වගන්තිය යටතේ විශේෂිත පෞද්ගලික මාරු කිරීම් සඳහා අනුමැතිය | 525 | 469 |
| කොමිෂන් සභා පනතේ 28 වන වගන්තිය යටතේ තැරුව් බිමෙන් පිටත මාරුකිරීම් (Off the floor transfers) සඳහා අනුමැතිය | 175 | 146 |
| වාර්ෂික වාර්තා සමාලෝචනය කිරීම | වාර්ෂික වාර්තා 111 ක් අතුරින් වාර්ෂික වාර්තා 57 ක් සමාලෝචනය කර ඇත. | වාර්ෂික වාර්තා 113 ක් අතුරින් වාර්ෂික වාර්තා 75 ක් සමාලෝචනය කර ඇත. |

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට විමර්ශන අංශය විසින් හසුරුවන ලද සිද්ධීන් 31 අතුරින් සිද්ධීන් දෙකක් සම්පූර්ණ කර තිබූ අතර එක් සිද්ධියක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබූ අතර තවත් සිද්ධියක් ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි අංශය වෙත යොමු කර තිබුණි. අනෙකුත් සිද්ධීන් 27 හි විමර්ශන කටයුතු කෙරිගෙන යමින් පැවතුණි.

**4.2** **මෙහෙයුම් අකාර්යක්ෂමතාවයන්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තැරැව්කරුවන්ගේ පසුපෙල කාර්යාල පද්ධතිය (Broker Back Office Systems - BBO) සහ ඇණවුම් කළමනාකරණ පද්ධතිය (Order Management System - OMS) සඳහා අරමුදල් යෙදවීමට අදාළ නියමයන් හා කොන්දේසි වලට ප්‍රකාරව, BBO සහ OMS පද්ධතිවල ක්‍රියාකාරි තත්ත්වය (Go Live) 2016 මාර්තු 31 දින හෝ එදිනට පෙර ළඟාකර ගත යුතු අතර කිසියම් ප්‍රමාදයක් වේනම් සම්පූර්ණ ප්‍රදානය සියයට 25 සිට සියයට 100 දක්වා අඩු කරනු ලබයි. ව්‍යාපාර වස්තු තැරැව්කාර සමාගම් 5 ක් මෙම අවශ්‍යතාවය සම්පූර්ණ කර නොතිබූ නමුත්, කොමිෂන් සභාව විසින් සම්පූර්ණ ප්‍රදානයම ඉහත ව්‍යාපාර වස්තු තැරැව්කාර සමාගම් වෙනුවෙන් යෙදවීමට අනුමැතිය ලබා දී තිබුණි.

(ආ) මූල්‍ය වෙළඳපලේ පියවීමේ අවධානම අවම කිරීම සහ නිෂ්කාශන හා පියවීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා මධ්‍යම පාර්ශවීකරණ යාන්ත්‍රණය (Central Counter Party Mechanism - CCP) ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදේශන හා ව්‍යාපෘති කළමනාකරණ සේවා ලබා ගැනීම සඳහා 2015 ජනවාරි මාසයේදී උපදේශක සමාගමක් පත් කර තිබුණි. කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා මහ බැංකුව සහ කොමිසම සභාව එක්ව එළඹෙන ලද ත්‍රෛපාර්ශවික ගිවිසුමක් අනුව උපදේශන ගාස්තුවද ඇතුලත්ව ව්‍යාපෘතියේ පිරිවැය ඔවුන් විසින් සම සමව දරණු ලබයි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළදී කොමිෂන් සභාව විසින් පළවන අදියරේ උපදේශන ගාස්තුවෙන් සිය කොටස වන රුපියල් මිලියන 22.2 ක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, මෙම ත්‍රෛපාර්ශවික ගිවිසුමෙන් ශ්‍රී ලංකා මහ බැංකුව 2015 දී ඉවත් වී තිබූ අතර, ව්‍යාපෘතියේ අනෙත් අදියර හතර අවසන්වීමෙන් තොරව ත්‍රෛපාර්ශවික ගිවිසුම අවසන් වී තිබුණි.

**4.3** මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1992 මාර්තු මස 31 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ලිපියට ප්‍රකාරව, වෙනත් රාජ්‍ය රෙගුලාසි සලකා බැලීමෙන් තොරව සිය කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට සහ ඔවුන්ගේ වැටුප් හා අනෙකුත් දීමනා ගෙවීම සඳහා කොමිෂන් සභාවට වරප්‍රසාද ලැබී තිබේ. කෙසේවෙතත්, කොමිෂන් සභාව විසින් ජාතික වැටුප් හා සේවක කොමිෂන් සභාව වෙතින් අවශ්‍ය එකඟතාවය ලබා ගෙන නොතිබුණි.

(ආ) කොමිෂන් සභාවේ එක් නිලධාරියෙකුගේ සේවය 2016 අප්‍රේල් 19 දින සිට බලපැවැත්වෙන පරිදි තහනම් කර තිබුණි. කෙසේවෙතත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 31.11 උප වගන්තියට පටහැනිව වාහන දීමනාව හා ප්‍රතිලාභ හැර මාසික දළ වැටුපෙන් හරි අඩක සමාන මුදලක් ගෙවීම් කරනු ලබයි. 2016 අප්‍රේල් සිට 2017 දෙසැම්බර් දක්වා අර්ධ මාසික දළ වැටුප් වශයෙන් එකතුව රු. 3,397,364 ක් ඔහුට ගෙවා තිබුණි.

(ඇ) කොමිසම් සභාවේ පරිපාලන අත්පොත අනුව, හදිසි තත්ත්වයක් මත අධ්‍යක්ෂ ජනරාල් වරයාට මාස 3 කට නොඅඩු කාල සීමාවකට අනියම් පදනම මත පුද්ගලයින් සේවයේ යෙදවිය හැකිය. කෙසේවෙතත්, 2015 ඔක්තෝබර් සිට තාවකාලික පැවරුම් සඳහා පුද්ගලයන් හය දෙනෙකු ඉහත පදනම මත බඳවාගෙන තිබූ බව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අතර පුද්ගලයින් දෙදෙනෙකුගේ සේවය සමාන පැවරුම් සඳහා අවුරුද්දකට වැඩි කාල පරිච්ඡේදයකට දීර්ඝ කර තිබුණි. එමෙන්ම, එම පුද්ගලයන් බඳවාගැනීම සඳහා බඳවාගැනීමේ ක්‍රියාපටිපාටි අනුගමනය කර නොතිබුණි.

(ඈ) අධ්‍යක්ෂක පරීක්ෂණ, අධ්‍යක්ෂක ප්‍රාග්ධන වෙළෙඳපොල සංවර්ධන, අධ්‍යක්ෂක විමර්ශණ, අධ්‍යක්ෂක මානව සම්පත් සහ අධ්‍යක්ෂක ප්‍රාග්ධන වෙළඳපෙල අධ්‍යාපන හා පුහුණු යන තනතුරු පුරප්පාඩුව පැවති බව නිරීක්ෂණය විය.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත වියදම හා තථ්‍ය වියදම සැසදීමේදි සියයට 32 සිට සියයට 97 දක්වා පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වුයෙන්, අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබු බව නිරීක්ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු කොමිෂන් සභාවේ සභාපති වරයාගේ අවධානයට වරින් වර යොමුකරන ලදි. වියදම් දැරීම අයවැයගත සිමාවන් තුළ සිදුකිරිම සහ අයවැය තාර්කික ආකාරයකට පිළියෙළ කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.